ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2006/2007

පවුල් නීතිය - **LWU 2313**

කාලය - පැය තුනයි.

---

දිනය - 2007.03.12 වේලාව - පෙ.ව.10.00 - ප.ව.01.00 දක්වා

---

*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*
*<u>ප්‍රශ්න පහකට</u> පමණක් පිළිතුරු සපයන්න.*

01. "රාජ්‍ය පාර්ශ්වයන් විසින් ළමයාගේ ජාතිය, වර්ණය, ලිංග භේදය හා ආගම නොතකා කිසිදු වෙනස්කමකින් තොරව එක් එක් ළමයාට සිය අයිතිවාසිකම් සහතික කිරීම එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ 2 වන ව්‍යවස්ථාවෙන් අවශ්‍ය කෙරේ. කෙසේ වුවද ශ්‍රී ලංකාවේ ළමුන්ගේ තත්ත්වය දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ නීතිය විසින් යම් ප්‍රයත්නයන් ගෙන තිබුන ද මෙම ප්‍රමිතිය අත්කර ගැනීමට එය අසමත් වී ඇත."

ජනවර්ගය, උපත හා ආගම මත පදනම් වෙමින් ළමුන්ට වෙනස්කම් සිදුවන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මෙම ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

02. ගුණසිරි යුධ හමුදා භටයෙකි. අම්පාරේ සේවය කරමින් සිටිය දී ඔහු සෝමා නම් වැන්දඹුවක සමග පෙම් සබඳතාවක් ආරම්භ කළේය. සෝමාට ජගත් නම් දෙහැවිරිදි දරුවකු ද විය. 2003 දී ගුණසිරි සෝමා හා ජගත් රැගෙන සිය මැදවච්චියේ නැන්දණියගේ නිවසට ගියේය. සෝමා සමග එක්වීම සැමරීම සඳහා සාදයක් සූදානම් කල ඔහු නිවසට පැමිනි ආරාධිතයින්ට මත්පැන්වලින් හා රාත්‍රී භෝජන සංග්‍රහයකින් සංග්‍රහ කළේය. ඉන්පසුව ගුණසිරි හා සෝමා නැන්දණියගේ ඉඩමට ආසන්න ඉඩමක කුඩා පැලක් ඉදිකරගෙන එහි අඹුසැමියන් වශයෙන් වාසය කළ හ. ඔහු නොකඩවා සිය පවුලේ අය බැලීමට පැමිණි අතර එසේ පැමිණිය නොහැකි අවස්ථාවල දී මුදල් එව්වේ ය. 2005 දී සෝමාට දරුවකු ලැබුණ අතර ඇය සුමනා යන නමින් හඳුන්වනු ලැබීය. 2006 ජනවාරි මාසයේ හමුදාවෙන් පලාගිය ගුණසිරි බලධාරීන් විසින් තමා අත්අඩංගුවට ගනු ලැබීමේ බිය හේතුකොටගෙන නිවසට ඒමෙන් වැළකී සිටියේය. පසුව ඔහු පවුලේ ජීවිකාව සඳහා මුදල් එවීම නතර කළේය. ගුණසිරි වෙනත් කාන්තාවක් සමග පුත්තලමේ ජීවත් වන බව සෝමාට දැන ගන්නට ලැබිණි.

තමා සහ තම දරුවන් දෙදෙනා නඩත්තු කිරීම සම්බන්ධයෙන් ගුණසිරිගේ වගකීම පිළිබඳව සෝමා ඔබෙන් උපදෙස් පතයි.

(අ) සෝමාට උපදෙස් දෙන්න
(ආ) ගුණසිරි සෝමා සමග වූ විවාහය 2006 ජනවාරි දී ලියාපදිංචි කළේ නම් ඔබේ පිළිතුර වෙනස් වන්නේ ද?

03. කමලා හා යෝගරාජා තේසවලමෙහි නීතියෙන් පාලනය වන විවාහක යුවළකි. විවාහයෙන් පසු ඔව්හු යෝගරාජා විසින් කුලියට ගනු ලැබූ නිවසක වාසය කළහ. යෝගරාජාගේ විවාහය වෙනුවෙන් කමලාගේ දෙමාපියෝ යෝගරාජාට විශාල දෑවැද්දක් දුන්හ. හලාවත පිහිටි අක්කර දෙකක පොල් ඉඩමක් හා රුපියල් මිලියනයක මුදල් දෑවැද්දට අයත් විය. ටික කලකට පසු ඔවුන් දෙදෙනා දබර කරගන්නට පටන් ගත්හ. එක් දිනක් යෝජරාජා වෛවාහක නිවස හැරගොස් සිය දෙමාපියන් සමග ජීවත්වීමට ගියේය. තමන් විසින් කලියට ගත් නිවසින් තමා ඉවත්ව ගිය බව ඔහු ගෙවල් හිමියාට දැනුම් දුන්නේ ය. යෝගරාජාගෙන් වෙන්වීමට හෝ දික්කසාදයක් ලබා ගැනීමට හෝ කමලා අදහස් නොකරයි.

(අ) සාමාන්‍ය නීතිය යටතේ සැමියා විසින් අත්හැර දමනු ලැබූ භාර්යාවක් වශයෙන් තමාට ඇති අයිතිවාසිකම්.

(ආ) තේසවලමෙයි නීතිය යටතේ තම නිශ්චල දේපළ අන්සතු කිරීම.

සම්බන්ධයෙන් විනිශ්චිත නඩු තීරණ ආශ්‍රයෙන් කමලාට උපදෙස් දෙන්න.

04. සුනිමල් හා මාලා සාමාන්‍ය නීතිය යටතේ විවාහක යුවළකි. සුනිමල්ගේ එකම සහෝදරිය වූ කුමාරි හදිසි අනතුරකින් මිය ගිය පසු ඇගේ සැමියා වූ ලාල් සිය 10 හැවිරිදි පුත්‍රයා සුනිමල් හා මාලාට භාර දී විදේශගත වීමට තීරණය කළේය. කෙසේ වුව ද පුත්‍රයා නීත්‍යානුකූලව දරුකමට හදා ගැනීමට සුනිමල් හා මාලා අදහස් කරති.

(අ) අදාල පාර්ශවයන් විසින් සපුරාලිය යුතු අවශ්‍යතා.
(ආ) අනුගමනය කළ යුතු නෛතික පරිපාටිය
(ඇ) දරුවා දරුකමට හදා ගැනීමේ නෛතික ප්‍රතිඵල

පිළිබඳව සුනිමල්ඔබෙන් උපදෙස් පතයි. ඔහුට උපදෙස් දෙන්න.

05. පහත සඳහන් අවස්ථාවල දී ශ්‍රී ලංකා නීතියේ ඒකමතික බවක් ඇත්තේ දැයි සාකච්ඡා කරන්න.

(අ) අන්තිම කැමති පත්‍රයක් රහිත අනුප්‍රාප්තිය

(ආ) නීත්‍යානුකූල විවාහයක් ඇති කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු නෛතික අවශ්‍යතා

06. ජෙයම් හා සීතා කෙටි දැන හැඳින ගැනීමකින් පසු විවාහ වූහ. සාමාන්‍ය නීතිය යටතේ සිය විවාහය ලියාපදිංචි කළ ඔවුහු ජෙයම්ගේ කොළඹ පිහිටි සුඛෝපභෝගී නිවසේ වාසය කළහ. සීතා නඩත්තු කිරීම සඳහා තමාට ප්‍රමාණවත් ආදායමක් ඇති හෙයින් සීතා සේවය කරමින් සිටි බැංකුවේ විධායක තනතුරින් ඉල්ලා අස්විය යුතු බව විවාහයෙන් පසු ජෙයම් කියා සිටියේය. කෙසේ වුව ද සිය රැකියාවෙන් අස්වීමට සීතා අකමැති වූවා ය. සීතා බැංකුවේ වෙනත් විධායක නිළධාරියෙකු සමග අනියම් සම්බන්ධයක් පවත්වන බව ජෙයම් පසුව චෝදනා කර සිටියේය. කිහිප අවස්ථාවක දී මත්පැන් පානය කිරීමෙන් පසු නිවසට පැමිනි ජෙයම් සීතාට පහර දුන්නේ ය. තමාට නිවසේ වෙනමකාමරයක ජීවත් වීමට අවශ්‍ය බව පැවසූ ජෙයම් ඇය සමග ආහාර ගැනීම පවා ප්‍රතික්ෂේප කළේය. ඉන්පසුව ඔහු සීතා සමග කථා කිරීම නැවැත්විය. දිනක් සීතාට සිය නිවසින් පිට වී යන ලෙස ජෙයම් නියෝග කළේය. සීතා සිය දෙමාපියන් සමග ජීවත්වීමට ගියාය. තමාට ලබා ගත හැකි වෛවාහක සහන පිළිබඳව සීතා ඔබෙන් උපදෙස් පතයි.

(අ) අදාල නඩු තීන්දු ඉදිරිපත් කරමින් සීතාට උපදෙස් දෙන්න.

(ආ) පාර්ශ්වකරුවන් උඩරටියන් වූයේ නම් හා ඔවුන්ගේ විවාහය උඩරට නීතිය යටතේ ලියාපදිංචි කර තිබුණේ නම් ඔබේ පිළිතුර වෙනස් වන්නේ ද?

07. ශ්‍රී ලංකාවේ නීති යටතේ බාලවයස්කාර දරුවන්ගේ භාරකාරත්වය පිළිබඳ ආරවුල්වලදී දරුවාගේ යහපත පිළිබඳ සංකල්පය යොදා ගන්නා ආකාරය විනිශ්චිත නඩු තීරණ ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

08. "නීත්‍යානුකූල විවාහයෙන් පරිබාහිරව උපන් දරුවන් සමහර අශක්නුතාවලට යටත් වුව ද සිය දුක්ඛර තත්ත්වයෙන් මිදීම සඳහා ඔවුනට සමහර සහන ඇත්තේ ය."

ශ්‍රී ලංකාවේ විවිධ නීති යටතේ විවාහයෙන් පරිබාහිරව උපන් දරුවන්ගේ තත්ත්වය සහ ඔවුන්ගේ තත්ත්වයට සහන සැලසීම් සඳහා ඇති නෛතික පරිපාටි කෙරෙහි අවධානය යොමු කරමින් මෙම ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

- හිමිකම් ඇවිරිණි. -